**චීන සංවර්ධන බැංකුව විසින් අරමුදල් සම්පාදිත ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 කොටස - 2018**

චීන සංවර්ධන බැංකුව විසින් අරමුදල් සම්පාදිත ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 කොටසේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන සංවර්ධන බැංකුව අතර 2011 මාර්තු 31 දින එළඹි අංක 4500062212011110472 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) අනු ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වූ වර්තමානයේ මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කිලෝමීටර් 619.72 ක ප්‍රමුඛතා මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීමයි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 61,438 කට සමාන එ.ජ.ඩො. මිලියන 556 ක් වූ අතර ඉන් රු. මිලියන 55,250 කට සමාන එ.ජ.ඩො. මිලියන 500 ක් මූල්‍යායනය කිරීමට චීන සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 ජූනි 28 දින ආරම්භ කරන ලද අතර 2014 ජූනි 28 දින නිම කිරීමට නියමිතව පැවතුණි. කෙසේ වෙතත්, ණය වලංගු කාල සීමාව ගෙවීම් අවසන් වන තෙක් දීර්ඝ කර තිබුණි.

**1.3 තත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කළමනාකාරීත්වය විසින් වැඩසටහන ඇවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට අදහස් කරන්නේ නම් මිස හෝ එසේ කිරීම හැර යථාර්තවාදී විකල්පයක් නොමැති විට අඛණ්ඩ පැවැත්ම ඉදිරියට පවත්වා ගැනීමට ව්‍යාපෘතියේ හැකියාව තක්සේරු කිරීම, අදාල වන පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ කරුණු හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම සංකල්පය භාවිතා කිරීම කළමනාකරණයේ වගකීමවේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | 2015 ජූනි 22 දින ව්‍යාපෘතිය නිමකර තිබුණද ව්‍යාපෘතිය විසින් 2018 දෙසැම්බර් 31 දිනට ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළින් සත්‍ය මූල්‍ය ප්‍රගතිය නිරූපණය නොවීම. | අතීතයේදී සිදුකළ පරිදි ඇවර කිරීමේ වාර්තාව පිළියෙල කරන ලදී. | ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගත යුතුවේ. |
| (ආ) | 2014 සහ 2015 වර්ෂවලදී බදුල්ල - කරාමැටිය - අඳාඋල්පොත මාර්ගය සහ තැන්නේකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගය අවසන් කර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරාදී තිබුණද ගංවතුර මඟින් ඒවාට හානිවී තිබූ අතර ව්‍යාපෘතියේ විෂය පථය හඳුනා ගැනීමෙන් තොරව රු.මිලියන 132 ක පිරිවැයකට අලුත්වැඩියා කිරීම සඳහා නැවත ප්‍රදානය කර තිබුණි. රු.මිලියන 19.48 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. 2018 දෙසැම්බර් 31 වනවිට අලුත්වැඩියා කටයුතු නිමකර නොතිබුණද අත්තිකාරම් වශයෙන් හඳුනා නොගෙන 2015 වර්ෂයේදී අත්තිකාරම ප්‍රාග්ධනීත කර තිබුණි. | කෙරීගෙන යන වැඩ වැඩියෙන් පෙන්නුම් කිරීම. | හානියට පත් මාර්ග කොටස් අලුත්වැඩියා කිරීම හදිසි බැවින් සහ මහජන ආරක්ෂාව සහ පහසුව සහතික කිරීම සඳහා වැදගත් බැවින් කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරමක් ගෙවන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලීම් කරන ලදී. | හිඟ ශේෂය කොන්ත්‍රාත්කරු ගෙන් අය කර ගත යුතුයි. |
| (ඇ) | 2018 ජනවාරි 01 දිනට මුදල් ශේෂය වූ රු.මිලියන 56.6 ක් සමාලෝචිත වර්ෂය තුලදී මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගෙන නොතිබුණි. තවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍යයන ක්‍රියාකාරකම් ලෙස පෙන්නුම් නොකර එම මුදල 2018 ජනවාරි 23 දින දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය වෙත මාරු කර තිබුණි. | වාර්තා නොවූ මුදල් ශේෂයන් අවභාවිතා කිරීමට හැකිවීම. | ආරවුල් විනිශ්චය මණ්ඩලයේ සහ සුහද නිරවුල් කිරීමේ ක්‍රියාවලිවල ප්‍රමාදයන් නිසා මුදල සම්පූර්ණයෙන් උපයෝජනය කිරීමට නොහැකි අතර එම නිසා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉතිරි ශේෂය වන රු.මිලියන 56.6 ක මුදල දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය වෙත මාරු කිරීමට අනුමත කරන ලදී. | එක් එක් සහ සෑම ගනුදෙනුවක්ම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කල යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ජ'නල් සටහන් අංක 07 ට අනුව සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත් 07 කට අදාලව ශුද්ධ වත්කම් අගය වන රු.මිලියන 145 ක් සහ කොන්ත්‍රාත් 03 කට අදාලව රු.මිලියන 13 ක බැර ශේෂයක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කරන ලද වත්කම් ගිණුම්ගත කිරීම යන විස්තරය යටතේ මාරු කර තිබුණි. කෙසේ වුවද, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තහවුරු කළ පරිදි 2018 වර්ෂය තුළදී මාරු කරන ලද වත්කම් කිසිවක් නොවීය. | වාර්තා නොමැති වීමෙන් වත්කම් අවභාවිතා කිරීමට ඇති හැකියාව. | සෑම ව්‍යාපෘතියක් විසින්ම වැඩ අවසන් කරන ලද අවස්ථාවේදී එම ස්ථාවර වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත නියමාකාරයෙන් මාරු කරන ලදී. | නිවැරදි වේලාවේදී අදාල ගනුදෙනු වාර්තා කළ යුතුවේ. |

3. භෞතික කාර්යසාධනය
-------------------------

3.1 ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික ප්‍රගතිය
-------------------------------------------

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතිය ජාතික මාර්ග කිලෝමීටර 504.90 ක් සහ ප්‍රාදේශීය මාර්ග කිලෝමීටර 85 ක් පුනරුත්ථාපනය කිරීමට, ගුවන් පාලම් 02 ක් ඉදිකිරීමට, පාලම් 46 ක් පුළුල් කිරීමට සහ පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කළද, ජාතික මාර්ග කිලෝමීටර් 514.10 ක්, ප්‍රාදේශීය මාර්ග කිලෝමීටර 105.62 ක් සහ පාලම් 02 ක් පමණක් නිමකර තිබුණි. | ව්‍යාපෘතිය විසින් අනවශ්‍ය වියදම් දැරීමට හැකියාවක් ඇත. | එකඟ වේ. | ඉතිරි මාර්ග පුනරුත්ථාපන වැඩ ඉක්මනින් ඉටුකිරීමට පියවර ගත යුතුවේ. |

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විචලතා නියෝග සහ ආරවුල් විනිශ්වය මණ්ඩල සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දේශීය බැංකු 02 කින් අතිරේක ණය 02 ක් ලබාගෙන තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීම සඳහා අරමුදල් කළමනාකරණය කරගැනීමට ව්‍යාපෘතිය අසමත් වී තිබුණි. එම නිසා, හිඟ ණය ශේෂය වූ රු.මිලියන 2,900.06 ක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණි. | විචලතා නියෝග පසුව පිළිගැනීම නිසා අනවශ්‍ය ව්‍යාපෘති කළමනාකරණ පිරිවැයක් ඇතිවීමට හැකියාව පවතී. | එකඟ වේ. | අනාගත ව්‍යාපෘතිවලදී අරමුදල කළමනාකරණය ව්‍යාපෘතියේ ස්ථාපිත අරමුණු තුළ සිදුවිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘති අරමුදල්වලින් මිලදී ගත් ජංගම නොවන වත්කම් හොඳ තත්ත්වයෙන් සේවා යෝජකයා වෙත නැවත භරදිය යුතු වුවත් කොන්ත්‍රාත්කරු විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කරන ලද වත්කම් සහ කොන්ත්‍රාත්කරු විසින් මිලදී ගත් ස්ථාවර වත්කම් අතර රු. මිලියන 117 ක වෙනසක් විය. | වාර්තා නොමැති වීමෙන් වත්කම් අවභාවිතා කිරීමට ඇති හැකියාව. | විද්‍යාගාර උපකරණ සහ මිනුම් උපකරණද මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කරන ලදී. | පිරිවැයන් හඳුනා ගැනීම, අන්තර් ගෙවීම් සහතික සමඟ අනුකූල විය යුතුය. |